**ඇමුණුම 1**

**mCash සේවා කොන්දේසි**

සේවා භාවිතා කිරීම අරඹයා පාරිභෝගිකයා හට බලපැවැත්වෙන කොන්දේසි පහත පරිදි වේ.

ශ්‍රී ලංකාවේ නීති යටතේ නිසි පරිදි සංස්ථාගත කරන ලද සමාගමක් වන මොබිටෙල් (පුද්ගලික) සමාගම විසින් සපයනු ලබන සේවාව සමාගම් ලියාපදිංචි අංකය: PV9478 සහ එහි ලියාපදිංචි කාර්යාලය අංක 109, ගාලු පාර,කොළඹ 03, ශ්‍රී ලංකාව (මෙතැන් සිට "මොබිටෙල්" ලෙස හැඳින්වේ).

mCash පාරිභෝගික කාණ්ඩය, පාරිභෝගික ගාස්තු හා mCash ගනුදෙනු සීමාවන් සඳහා කරුණාකර www.mobitel.lk පිවිසෙන්න.

mCash සේවාව සඳහා පාරිභෝගික ලියාපදිංචිය ප්‍රතික්ෂේප කිරීමේ හෝ අවලංගු කිරීමේ අයිතිය මොබිටෙල් සතුවෙයි.

## 1. අර්ථ දැක්වීම්

1.1 "මුදල් ගෙවීම" යන්නෙන් භෞතික වශයෙන් මුදල් ගෙවීම මඟින් mCash ගිණුමකට mCash ලබාගැනීමේ ක්‍රියාවලිය අදහස් වේ.

1.2 "මුදල් ලබාගැනීම" යන්නෙන් mCash ගිණුමක ඇති mCash භාරදීම මඟින් භෞතික වශයෙන් මුදල් ලබාගැනීමේ ක්‍රියාවලිය අදහස් වේ.

1.3 “දෛනික ගනුදෙනු සීමාව” යන්නෙන් එක් දිනයක් ඇතුළත mCash පාරිභෝගිකයකු සඳහා අවසරලත් ගනුදෙනුවල අවසරලත් උපරිම සමුච්චිත වටිනාකම අදහස් වෙයි.

1.4 “නීති” යන්නෙන් ශ්‍රී ලංකාවේ බලාත්මක නීති අදහස් වේ.

1.5 “mCash” යන්නෙන් mCash ගනුදෙනු ක්‍රියාත්මක කිරීම සඳහා mCash ක්‍රමය තුළ ඇතිකරන ලද ඉලෙක්ට්‍රොනික මුදල් ප්‍රමාණය අදහස් වේ.

1.6 “MSISDN” යන්නෙන් ජංගම දුරකථන අංකය අදහස් වේ.

1.7 “mCash ගිනුම” යන්නෙන් mCash ගනුදෙනු ක්‍රියාත්මක කිරීම සඳහා සෑම mCash පාරිභෝගිකයකු හෝ mCash වෙළෙන්දෙකු හෝ මොබිටෙල් සඳහා මොබිටෙල් විසින් mCash පද්ධතිය තුළ නිර්මාණය කොට පවත්වාගෙන යනු ලබන පුද්ගලික පොලී නොමැති ඩිජිටල් ගිණුම අදහස් වේ.

1.8 “mCash පාරිභෝගිකයා” යන්නෙන් mCash ගනුදෙනු ඉටුකිරීමේ හැකියාව ඇති mCash ගිණුමක් සහිත මොබිටෙල්/ ජාල හවුල්කරුවකු අදහස් වේ.

1.9 “mCash වෙළෙන්දන්” යන්නෙන් mCash සේවාවන් සඳහා පහසුකම් සැලසීම පිණිස මොබිටෙල් විසින් පත්කරන ලද තැනැත්තකු හෝ සංවිධානයක් හෝ ආයතනයක් අදහස් වන අතර, ඊට mCash බෙදාහරින්නා (Distributor), mCash සිල්ලර වෙළෙන්දා (Retailer) සහ mCash විකුණුම්කරු (Vendor) ඇතුළත් වේ.

1.10 “mCash සේවාව” යන්නෙන් mCash ගනුදෙනු ඉටුකිරීම සහ/හෝ ක්‍රියාත්මක කිරීම සඳහා mCash පාරිභෝගිකයාට සහ/හෝ mCash වෙළෙන්දාට අවසර ලබාදෙන මොබිටෙල් විසින් සලසනු ලබන ජංගම ගෙවීම් සේවාවක් අදහස් වේ.

1.11 “mCash පද්ධතිය” යන්නෙන් mCash ගනුදෙනු සඳහා පහසුකම් සැලසීම පිණිස මොබිටෙල් විසින් ක්‍රියාත්මක කරනු ලබන ජංගම ගෙවීම් පද්ධතිය අදහස් වේ.

1.12 “මොබිටෙල් වෙබ් අඩවිය” යන්නෙන් “www.mobitel.lk” අදහස් වේ.

## 2 ගිවිසුම ආරම්භ කිරීම

2.1 මෙම ගිවිසුම ලියාපදිංචි කළ දින සිට ගිවිසුම අවසන් කරන තෙක් ගිවිසුම බලාත්මකව පැවතේ.

## 3 mCash සේවාන් සම්බන්ධ පූර්ව අවශ්‍යතා

3.1 mCash සේවාව දැනට සිටින මොබිටෙල් පාරිභෝගිකයින්ට සහ ජාල හවුල්කරුවන්ට පමනක් සැපයේ.

3.2 mCash සේවාව ශ්‍රී ලංකා රුපියල් වලින් පමණක් සැපයිය යුතු අතර, දේශීය ගනුදෙනු සඳහා පමණක් භාවිතා කළ යුතුය.

3.3 ශ්‍රී ලංකාවේ පදිංචි වයස අවුරුදු 18 ට වැඩි මොබිටෙල් පාරිභෝගිකයින් / ජාල හවුල්කරුවන් mCash සේවාව යටතේ ලියාපදිංචිය සඳහා සුදුසුකම් ලබයි.

3.4 මොබිටෙල් විසින් නිශ්චය කර ඇති තොරතුරු සපයන පාරිභෝගිකයින් පමණක් mCash සේවාව සඳහා ලියාපදිංචි වීමට සහ එය අඛණ්ඩව භාවිතා කිරීමට සුදුසුකම් ලබයි. mCash පාරිභෝගිකයින් අවසරලත් සේවාවන්හී පමණක් නියැලී සිටින බවට තහවුරු කර ගැනීම සඳහා mCash පාරිභෝගිකයන්ගේ ක්‍රියාකාරකම් අධික්ෂණය කිරීමේ අයිතිය මොබිටෙල් සතුව පවතින අතර, 2006 අංක 06 දරන මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත ප්‍රකාර ස්ථාපිත කර ඇති මූල්‍ය බුද්ධි ඒකකය (FIU) මඟින් නිකුත් කර ඇති රෙගුලාසි ප්‍රකාර යම් සැක කටයුතු ගනුදෙනු පිළිබඳව අදාළ අධිකාරීන් වෙත වාර්තා කිරීමේ හැකියාව හා අයිතිය මොබිටෙල් සතුවේ.

3.5 මොබිටෙල් විසින් ස්වකීය තනි සහ පරම අභිමතය පරිදි mCash සේවාව සම්බන්ධ පහත සඳහන් ගනුදෙනුවල නිරතවීමට mCash පාරිභෝගිකයින්ට අවසර ලබාදෙනු ලැබේ;

3.5.1 mCash වෙළෙන්දන් වෙතින් යම් භාණ්ඩ සහ/හෝ සේවාවන් මිළදී ගැනීම සඳහා,

3.5.2 mCash මගින් උපයෝගීතා බිල්පත් ගෙවීම සඳහා,

3.5.3 මුදල් ඇතුලත් කිරීම සහ ලබාගැනීම සඳහා,

3.5.4 mCash ගිණුමක ඇති මුදල් තවත් mCash ගිනුමකට යැවීම සඳහා,

3.5.5 මොබිටෙල් විසින් නියම කරන ලද අගය එකතු කළ සේවාවන් ක්‍රියාත්මක කිරීම සඳහා,

3.5.6 ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කර ඇති පරිදි කලින් කලට මොබිටෙල් විසින් හඳුන්වා දෙනු ලබන වෙනත් යම් ගනුදෙනු සිදුකිරීම් සඳහා.

3.6 මොබිටෙල් විසින් පළමු අවස්ථාවේදී ම mCash සේවා ලියාපදිංචි කිරීමේ ක්‍රියා පටිපාටියක් ඇත. එසේ වූව ද, සනාථ කිරීමේ ලේඛන ඉදිරිපත් කිරීමෙන් අනතුරුව mCash පාරිභෝගිකයකු විසින් ඔහුගේ /ඇයගේ ලියාපදිංචි නම, ජංගම දුරකථන අංකය, වෙනස් කරන ලෙස ඉල්ලා සිටින්නේ නම්, දැනට පවත්නා ලියාපදිංචිය අවලංගු කර නැවත නව ලියාපදිංචියක් සිදුකරනු ඇත. mCash පාරිභෝගිකයකු සනාථ කිරීමේ ලේඛන ඉදිරිපත් කොට වෙනත් යම් දත්ත වෙනස් කරන ලෙස ඉල්ලා සිටින්නේ නම් අවශ්‍ය පරිදි සහ අවශ්‍ය අවස්ථාවන්හීදී දැනට පවත්නා mCash ගිණුමේ තොරතුරු ඒ අනුව යාවත්කාලීන කරනු ඇත.

3.7 mCash පාරිභෝගිකයකු විසින් සිදුකරනු ලබන mCash ගනුදෙනු, කොන්දේසිවලට යටත්ව ආපසු හැරවීමට හැකිය.

3.8 mCash ගිනුම් වෙත සිදුකරනු ලබන මුදල් ලැබීම් සහ mCash ගිනුම වෙතින් ලබාගනු ලබන මුදල් පිළිබඳව සහ ඔහුගේ /ඇයගේ mCash ගිනුමේ ඇති මුදල් වටිනාකම් ඉහළයාම/ පහළයාම සහ සිදුවන අනෙකුත් ගනුදෙනු පිළිබඳව ද කාලීනව mCash පාරිභෝගිකයන් දැනුවත් කරනු ලබයි.

3.9 මොබිටෙල් විසින් එක් එක් mCash පාරිභෝගිකයා වෙත වෙනම mCash ගිනුමක් විවෘත කොට පවත්වාගෙන යා යුතු අතර mCash ගිනුම් ප්‍රකාශය mCash පාරිභෝගිකයින් වෙත ඉලෙක්ට්‍රොනිකව ලබාදෙනු ලබයි. ඉල්ලීම් කළ දින සිට උපරිම වශයෙන් මාස 3 ක කාලය සඳහා mCash පාරිභෝගිකයාට අදාල ගෙවීම් යටතේ සහ ලිඛිත ඉල්ලීම මත විස්තරාත්මක ගිනුම් ප්‍රකාශයක් ලබා දිය හැක.

3.10 mCash මූල්‍යමය වටිනාකමට එකතු කළ යුතු mCash ගිණුම් ශේෂයන් මත ණය, පොලී හෝ ලාභ ස්වරූපයේ කිසිදු ප්‍රතිලාභයකට හෝ mCash ගිනුමේ මූල්‍යමය වටිනාකම නොඉක්මවන වෙනත් යම් මූල්‍ය පහසුකම් හෝ mCash මත වට්ටම් ලබාගැනීමට හෝ mCash පාරිභෝගිකයන් හිමිකම් නොලබයි.

3.11 mCash ගිනුමේ ගනුදෙනු සීමාවන් සහ දෛනික ගනුදෙනු සීමාව ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතිය සහිතව මොබිටෙල් විසින් නිශ්චය කරනු ලැබේ. mCash පාරිභෝගිකයින් අදාළ නිශ්චිත සීමාවන්ට අනුකූලව කටයුතු කළ යුතු අතර, mCash පාරිභෝගිකයින් දැනුවත් කිරීමෙන් අනතුරුව ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතිය සහිතව එකී සීමාවන් වෙනස් කිරීමට මොබිටෙල් වෙත අයිතිය ඇත.

3.12 mCash පාරිභෝගිකයකු වශයෙන් ලියාපදිංචි කිරීම මත, mCash පාරිභෝගිකයකු විසින් ඔහුට අදාළ, සංඛ්‍යා 4 කින් යුක්තව රහස්‍ය අංකයේ රහසිගත භාවය ආරක්ෂා කිරීම සහ හෙළිදරව් නොකිරීම සම්බන්ධයෙන් mCash පාරිභෝගිකයින් වගකීම දැරිය යුතුය.

3.13 අවසර පද, රහස්‍ය අංක වැනි යම් රහස්‍ය තොරතුරු ජංගම දුරකථනවල ගබඩා නොකරන මෙන් පාරිභෝගිකයින්ට තරයේ උපදෙස් දෙන අතර, එම දුරකථන විකිණීමේ දී හෝ අන් අයට ලබාදීමේ දී, එකී තොරතුරු මකා දැමිය යුතු බවට ද, තරයේ උපදෙස් දෙනු ලැබේ.

3.14 ජංගම දුරකථනය නැතිවූ අවස්ථාවකදී ප්‍රයෝජනයට ගැනීම පිණිස එකී දුරකථනයේ IMEI සංකේතය වෙනම ස්ථානයක සඳහන් කර තබන ලෙස mCash පාරිභෝගිකයන්ට තරයේ උපදෙස් දෙනු ලැබේ.

3.15 mCash සේවාව සඳහා mCash පාරිභෝගිකයා ලියාපදිංචි වී ඇති මොබිටෙල් (MSISDN) අංකයේ නෛතික හිමිකම් එකී mCash පාරිභෝගිකයාම වන බවට ඔහු/ඇය මෙයින් සහතික කරයි.

3.16 mCash පාරිභෝගිකයා විසින් සිදුකරන mCash සේවා ගනුදෙනු අදාළ මොබිටෙල් අංකය (MSISDN) සහ රහස්‍ය අංකය හරහා පමණක් සිදුකළ හැකි බව සැළකිය යුතුය. එකී අංකය හරහා සිදුකරන සියලු ගනුදෙනු සම්බන්ධයෙන් mCash පාරිභෝගිකයා වගකීම දැරිය යුතුය.

3.17 mCash පාරිභෝගිකයකුගේ බලය පැවරීමක් සහිතව හෝ රහිතව ඔහුගේ /ඇයගේ මොබිටෙල් අංකය හරහා යම් තෙවන පාර්ශවයක් විසින් සිදුකරනු ලබන සියලුම ගනුදෙනු සම්බන්ධයෙන් mCash පාරිභෝගිකයා වගකීම දැරිය යුතු අතර, එකී තොරතුරු mCash පාරිභෝගිකයා විසින් සිදුකරන ගනුදෙනු වශයෙන් සලකනු ලබයි.

3.18 අදාළ සියලුම බදු සහ ගාස්තු ඇතුළත්ව mCash පාරිභෝගිකයා විසින් සිදුකරනු ලබන mCash ගනුදෙනු වලට අනුව මොබිටෙල් විසින් mCash පාරිභෝගිකයාගේ mCash ගිණුම හර/බැර කිරීම සිදු කළ හැකිය.

3.19 mCash ගනුදෙනුකරු විසින් මොබිටෙල් හී කීර්තිනාමයට හානියක් වන කිසිදු ක්‍රියාවක් හෝ අත පසු වීමක් සිදු නොකළ යුතු අතර, mCash සේවාව සම්බන්ධයෙන් යම් තෙවන පාර්ශවයක් විසින් මොබිටෙල් ආයතනයට එරෙහිව සිදුකරන යම් හිමිකම්පෑමක් හෝ ක්‍රියාවක් සම්බන්ධයෙන් ද සහභාගී නොවිය යුතුය.

## 4 mCash පාරිභෝගික වගකීම්

4.1 mCash පාරිභෝගිකයා ලියාපදිංචිය සඳහා ලබාදෙන ලද සියළුම තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, මොබිටෙල් විසින් කලින් කලට සාධාරණ ලෙස ඉල්ලා සිටින යම් අතිරේක තොරතුරු සපයනු ලබන බවටත්, mCash පාරිභෝගිකයා ප්‍රතිඥා දිය යුතුය. එකී තොරතුරු සැපයීමට අපොහොසත් වුවහොත් සේවා ලියාපදිංචිය අවසන් කිරීමට හෝ අත්හිටුවීමට සිදුවනු ඇත.

4.2 එකී තොරතුරු මොබිටෙල් මගින් රඳවා තබා ගත හැකි බවටත්, යම් පූර්ව දැනුම්දීමක් හෝ එකඟතාවක් නොමැතිව අදාල නීතිය යටතේ ඉල්ලා ඇති පරිදි එකී තොරතුරු භාරකාර බැංකුව වන කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී (Commercial Bank of Ceylon PLC) වෙත හෝ වෙනත් යම් අධිකාරයක් වෙත හෙළි කිරීමට, ගබඩා කිරීමට, භාවිතා කිරීමට, විශ්ලේෂණය කිරීමට,

සකස් කිරීමට මොබිටෙල්ට අයිතිය ඇති බවට mCash පාරිභෝගිකයා එකඟ වේ.

4.3 පාරිභෝගිකයා වෙතින් රැස්කරන ලද හෝ එහි ප්‍රතිපලයක් ලෙස මොබිටෙල් විසින් උත්පාදනය කරන ලද එකී දත්ත mCash සේවාව සැපයීමේ ක්‍රියාදාමය තුළදී අවශ්‍ය පරිදි සහ අවශ්‍ය අවස්ථාවන්හී දී එකී සේවාව සැපයීම සඳහා වන නිසි දත්ත කළමනාකරණ කාර්යයන් සඳහා අවශ්‍ය වන විට මොබිටෙල් විසින් වෙනත් රටවලට ඒවා හුවමාරු කරගැනීමට හැකි බවට පාරිභෝගිකයා එකඟ වේ.

4.4 mCash පාරිභෝගිකයා විසින් මෙම ගිවිසුම යටතේ දක්වා ඇති කිසිදු බැඳීමක්/කොන්දේසියක් උල්ලංඝනය නොකළ යුතුය.

4.5 mCash පාරිභෝගිකයා විසින් mCash ගිනුම් වංචනිකව හෝ වෙනත් පාරිභෝගිකයකු හෝ වෙනත් යම් තැනැත්තකු වෙනුවට වංචනික ඉදිරිපත් වීම මඟින් ලියාපදිංචි නොවිය යුතු අතර, මොබිටෙල් විසින් එවැනි වංචාවක් හෙළිදරව් කරගත් විටක, අදාළ mCash පාරිභෝගික ලියාපදිංචිය වහාම අත්හිටුවීම/ අවලංගු කිරීම සිදුවන අතර, එවැනි අයථා ක්‍රියාමාර්ග පිළිබඳව අදාළ නීතිමය අධිකාරීන් වෙත වාර්තා කරනු ඇත.

4.6 රහස්‍ය අංකය භාවිතයෙන්, සත්‍යාපනය කරන ලද සහතික කළ ලියාපදිංචි MSISDN හරහා සිදුකරන mCash ගනුදෙනු ආශ්‍රිත සියලු වාර්තා කෙරෙහි පාරිභෝගිකයා බැඳී සිටින අතර, එකී වාර්තා එම ගනුදෙනු සිදුකරන ලද බවට අවසානාත්මක සාක්ෂියක් වශයෙන් ද සලකනු ලැබේ.

4.7 රහස්‍ය අංකය යොදා ගනිමින් මොබිටෙල් අංකය (MSISDN) හරහා සිදුකරන ලද සියලුම ගනුදෙනු සම්බන්ධයෙන් mCash පාරිභෝගිකයා වගකීම දැරිය යුතු අතර, අදාළ mCash ගිනුම අඛණ්ඩව අධීක්ෂණය කිරීම සම්බන්ධයෙන් ද වගකීම දැරිය යුතුය.

4.8 වටිනාකම සහ ග්‍රාහක තොරතුරු ඇතුළත්ව නමුත් ඊට පමණක් සීමා නොවී mCash සේවාව හරහා සිදුකරනු ලබන සියලුම ගනුදෙනු පරීක්ෂා කිරීම සහ සත්‍යාපනය කිරීම සම්බන්ධයෙන් mCash පාරිභෝගිකයා වගකීම දැරිය යුතුය. mCash පාරිභෝගිකයාගේ නොසැලකිලිමත්කම හේතුවෙන් යම් ගනුදෙනු හෝ දෝෂ සහිත ඇතුළත් කිරීම් නැවත ලබාදීමේ කිසිදු ඉල්ලීමක් සළකා බැලීමට මොබිටෙල් බැඳී නොමැත.

4.9 මොබිටෙල් වෙතින් හෝ වෙනත් යම් තෙවන පාර්ශවයක් / මූලාශ්‍රයක් වෙතින් සැක කටයුතු තොරතුරු, අසම්පූර්ණ සහ වැරදි සහගත දත්ත ලැබී ඇත්නම් mCash පාරිභෝගිකයා වහාම මොබිටෙල් වෙත දැනුම්දිය යුතුය.

4.10 මොබිටෙල් අංකයක (MSISDN) ගුවන් කාලය mCash වෙත මාරු කිරීමට mCash පාරිභෝගිකයාට අවසර ලබා නොදෙයි. එසේ වුව ද, mCash ගිනුමේ ශේෂය භාවිතයෙන් mCash පාරිභෝගිකයාට ගුවන් කාලය මිළදී ගත හැකිය.

4.11 mCash පාරිභෝගිකයා විසින් mCash සේවාව යම් නීති විරෝධී හෝ නීත්‍යානුකූල නොවන ගනුදෙනු හෝ ක්‍රියාකාරකම් සඳහා භාවිතා නොකළ යුතු අතර, සෑම අවස්ථාවකදී ම අදාළ නීතිවලට සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කර ඇති නියෝගවලට අනුකූලව පරිභෝගිකයා කටයුතු කළ යුතුය.

4.12 මොබිටෙල් හී පූර්ව ලිඛිත අනුමැතිය නොමැතිව , mCash පාරිභෝගිකයකු විසින් මෙම ගිවිසුම යටතේ ස්වකීය බැඳීම් හෝ ඔහුගේ/ඇයගේ mCash ගිනුම යටතේ ඇතිවන බැඳීම් යම් තෙවන පාර්ශ්වයකට පැවරිය නොහැක. එවැනි අනවසර පැවරීමක් හේතුවෙන් ඇතිවන හානි හෝ අලාභ සම්බන්ධයෙන් මොබිටෙල් විසින් කිසිදු වගකීමක් නොදරයි.

4.13 mCash පාරිභෝගිකයා විසින් කවරාකාරම වූ අරමුණක් සඳහා mCash ගිණුම සුරැකුමක් වශයෙන් හෝ පොරොන්දුවක් වශයෙන් භාවිතා නොකළ යුතුය.

mCash පාරිභෝගිකයා විසින් සිදුකරනු ලබන එවැනි ක්‍රියාවක් හේතුවෙන් පැන නගින සෘජු හෝ වක්‍ර සියලුම වගකීම් වලින් මොබිටෙල් නිදහස් වේ.

## 5 ස්ථාවර නියෝග

පාරිභෝගිකයකු විසින් ඔහුගේ /ඇයගේ mCash ගිණුම හරහා නිශ්චිත දිනයක ක්‍රියාත්මක කළ යුතු ස්ථාවර නියෝග සම්බන්ධයෙන් අයදුම් කිරීමේදී පහත සඳහන් විධිවිධාන පිළිපැදිය යුතුය.

5.1 ස්ථාවර නියෝගයක් සඳහා ඉල්ලීමක් කිරීමේදී, ඒ සම්බන්ධයෙන් අදාළ වන යම් බදු වලට අමතරව, අදාළ අවස්ථාවන්හී දී යම් කොමිස් මුදල් අඩුකර ගැනීම සඳහා මොබිටෙල් වෙත අවසර ලබාදීමට පාරිභෝගිකයා එකඟ වන අතර, අදාළ mCash ගිණුමෙන්, පාරිභෝගිකයා ලබාදෙන ලද ස්ථාවර නියෝගයේ උපදෙස් වල සඳහන් පරිදි, අදාළ වටිනාකම අඩුකර ගැනීම සඳහා පාරිභෝගිකයා මොබිටෙල් වෙත බලය පවරයි.

5.2 යම් ස්ථාවර නියෝගයක් සඳහා වූ ඉල්ලීම ක්‍රියාත්මක කිරීමේදී එකී ක්‍රියාව නොකර හැරීම හෝ ප්‍රමාදය හෝ කවරාකාරම හේතුවක් මත පැන නගින යම් අලාභ සඳහා වන හිමිකම්පෑම සම්බන්ධයෙන් මොබිටෙල් විසින් පාරිභෝගිකයා හෝ වෙනත් යම් ප්‍රතිලාභියකු සම්බන්ධයෙන් වගකීමට බැඳී නොසිටිනු ඇත.

5.3 ස්ථාවර නියෝගයේ නියමිත දිනය ලඟාවීමට දිනකට පෙරාතුව පාරිභෝගිකයාට දැනුම් දෙනු ලැබේ.

5.4 නියමිත දිනට හෝ දින හතක සහන කාල සීමාව ඇතුළත හෝ මොබිටෙල් වෙත ගෙවීම් කිරීමට අපොහොසත් වන අවස්ථාවක දී (මුදල් ගෙවීමට නියමිත දිනය ද ඇතුළුව) ගිනුමේ ප්‍රමාණවත් අරමුදල් නොමැතිවීම හේතුවෙන් එකී

සහන කාල පරිච්ඡේදයට පසුව එළඹෙන දින එකී මුදල නොගෙවීම සම්බන්ධයෙන් මොබිටෙල් විසින් දැනුම් දෙනු ලැබේ.

5.5 ඉහත සඳහන් කරුණු නොතකා , ගෙවීම් කිරීමට අදාළ දිනයට පසු දින 7 ක් ඇතුළත (ගෙවීම් කිරීමට නියමිත දිනය ද ඇතුළත්ව ගණනය කරන ලද) ගිනුමේ අරමුදල් ඇත්නම් මිස ගිණුමේ අරමුදල් ප්‍රමාණවත් පරිදි නොමැති අවස්ථාවක ස්ථාවර නියෝගයක් ක්‍රියාත්මක කිරීමට මොබිටෙල් බැඳී නොසිටී.

5.6 මුදල් ගෙවිය යුතු නියමිත දින 3 ක් පැහැර හැරීමක් සිදුකරන ලද විටක පාරිභෝගිකයා වෙත දැන්වීමක් සහිතව හෝ රහිතව යම් ස්ථාවර නියෝගයක් අවලංගු කිරීමට මොබිටෙල් වෙත අයිතිය ඇත.

5.7 යම් මරණයක් සිදුවීම, බුන්වත් වීම/ විසුරුවා හැරීම පිළිබඳව සනාථ කිරීමේ ලේඛන සමඟ ලිඛිතව ස්ථාවර නියෝග අවලංගු කරන ලෙස මොබිටෙල් වෙත දන්වා සිටින්නේ නම් මිස ස්ථාවර නියෝග සඳහා වන ඉල්ලීමක්, පාරිභෝගිකයාගේ මරණය හෝ බුන්වත් බව / විසුරුවා හැරීම නොතකා අඛණ්ඩවම බලාත්මකව පවතී.

5.8 පාරිභෝගිකයා විසින් ස්ථාවර නියෝගය අවලංගු කරන ලෙස ලබාදෙන ලද උපදෙස් ඊළඟ මුදල් ගෙවීමට නියමිත දිනට දිනකට පෙර දිනයේ අදාළ mCash ගිණුම හරහා නියෝග කළ යුතුය.

## 6 ජංගම දුරකථන නැතිවීම හෝ අස්ථානගතවීම වාර්තා කිරීම සම්බන්ධ ක්‍රියා පටිපාටිය

6.1 ජංගම දුරකථනයක් නැතිවුවහොත් හෝ අස්ථානගත වුවහොත් mCash පාරිභෝගිකයා විසින් වහාම ඒ බව මොබිටෙල් ඇමතුම් මධ්‍යස්ථානය වෙත දැන්විය යුතු අතර, ජංගම උපාංගය නැතිවීමක්, වංචාකිරීමක් , සැකසහිත වංචාකිරීමක්, වංක භාවිතයක් හෝ සොරකමක් සහ mCash ගිණුම නීති විරෝධී ලෙස භාවිතා කිරීමක් පිළිබඳව පොලීසියට වාර්තා කළ යුතුය. එවැනි

දැනුම් දීමක් මත මොබිටෙල් ඇමතුම් මධ්‍යස්ථානය විසින් mCash ගිණුම අවහිර කරනු ලැබෙයි.

6.2 mCash ගිණුම අවහිර කිරීමෙන් අනතුරුව, mCash පාරිභෝගිකයා විසින් නව සිම්පතක් ලබාගත යුතු අතර, එම MSISDN අංකයම ඒ සඳහා ලබාගත හැකිය. අනතුරුව mCash ගිණුම නිදහස් කර ගැනීම සඳහා මොබිටෙල් වෙත සිය අනන්‍යතාව තහවුරු කර ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතුය.

6.3 විකල්පයක් වශයෙන් ඕනෑම මොබිටෙල් ශාඛාවකින් හෝ mCash වෙළෙණ්දෙකු මගින් ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව අනන්‍යතාව තහවුරු කිරීම මත mCash පාරිභෝගිකයාට තම mCash ගිණුමෙන් ගනුදෙනු සිදුකළ හැකිය.

6.4 ජංගම දුරකථනය නැතිවූ හෝ අස්ථානගත වූ බවට මොබිටෙල් ඇමතුම් මධ්‍යස්ථානය වෙත වාර්තා කරන තුරු, එකී දුරකථනය හරහා සිදුකරනු ලබන ගනුදෙනු සඳහා mCash පාරිභෝගිකයා වගකිව යුතුය.

6.5 නැතිවූ හෝ අස්ථානගත වූ සිම් කාඩ්පත සඳහා වෙනත් කාඩ්පතක් නිකුත් කිරීමේදී මොබිටෙල් විසින් නිශ්චය කරනු ලබන අතිරේක ගෙවීම් වලට පාරිභෝගිකයා යටත් වේ.

6.6 ඉහත සඳහන් කරුණු නොතකා, සිම්පත වංචනිකව නිකුත් කර ඇති බවට සැක කරන්නේ නම් හෝ නැතිවී හෝ විනාශ වී ඇති බවට හෝ mCash සේවාව භාවිතා කිරීම මඟින් mCash පද්ධතියට අවාදනමක් සිදුවිය හැකි බවට මොබිටෙල් විසින් නිශ්චය කරන්නේනම්, mCash ගිණුම නිදහස් කරන ලෙස ඉල්ලා ඇති පාරිභෝගික ඉල්ලීම අවලංගු කිරීමට මොබිටෙල් ආයතනයට හැකිය. එහි ප්‍රතිඵලයක් ලෙස mCash පාරිභෝගිකයාට සිදුවන යම් පාඩු පිරිවැය හෝ හානි සම්බන්ධයෙන් මොබිටෙල් ආයතනය විසින් වගකීමක් නොදරයි.

## 7 පාරිභෝගික ඇමතුම් මධ්‍යස්ථානය

7.1 mCash පාරිභෝගික විමසුම් සහ පැමිණිලි සම්බන්ධයෙන් mCash පාරිභෝගිකයින්ට 7111 හෝ 071 2755777 යන අංකයන්ට ඇමතිය හැකිය. ලැබෙන සෑම පැමිණිල්ලකටම යොමු අංකයක් ලබාදෙන අතර, ව්‍යාපාරික දින 3 ක් ඇතුළත එකී පැමිණිලි විසඳීම සඳහා මොබිටෙල් ප්‍රයත්න දරනු ලබයි.

## 8 mCash පාරිභෝගික ආරවුල් නිරාකරණය

8.1 mCash ගනුදෙනු සහ/හෝ ගාස්තු, අනෙකුත් වියදම්, බදු සහ ගාස්තු සම්බන්ධයෙන් යම් ආරවුලක් පිළිබඳ කරුණු ඉදිරිපත් කිරීමට mCash පාරිභෝගිකයාට හැකි අතර, එකී ගනුදෙනුව සිදු වූ දින සිට හෝ එකී ගාස්තු mCash ගිනුමෙන් අයකර ඇති දින සිට දින 30 ක් ඇතුළත එකී පැමිණිල්ල ඉදිරිපත් කළ යුතුය.

8.2 එකී ආරවුල් නිරාකරණය හෝ නිරවුල් කිරීමට මොබිටෙල් විසින් සෑම ප්‍රයත්නයක්ම ගනු ලබන අතර එකී ආරවුල් සම්බන්ධයෙන් මොබිටෙල් හී තීරණය අවසාන තීරණය වේ.

8.3 mCash සේවාව සම්බන්ධයෙන් මොබිටෙල් විසින් පවත්වාගෙන යනු ලබන ලඝු ඕනෑම වර්ගයක ආරවුලක් සම්බන්ධයෙන් සත්‍ය තොරතුරු මූලාශ්‍රයක් වශයෙන් සැළකිය යුතු බවටත්, එකී ලඝු මඟින් සපයනු ලබන තොරතුරු යම් ආරවුලක් නිරාකරණය කිරීම සම්බන්ධයෙන් අවසාන සහ තීරණාත්මක සාක්ෂියක් වන බවටත් පාරිභෝගිකයා එකඟ වේ.

## 9 ප්‍රතිචක්‍රීය කළ දුරකථන අංක සඳහා P2P ගනුදෙනු සහ වැරදි P2P මුදල් යැවීම්

9.1 දුරකථන අංක වල පවතින හිඟය හේතුවෙන් දින [×] ට වැඩි කාලයක් අක්‍රීයව පවතින හෝ නීතිය
මඟින් නිශ්චය කර ඇති කාලයක් අක්‍රීයව පවතින දුරකථන අංක සක්‍රීය කිරීමේ අයිතිය මොබිටෙල් සතුය. අක්‍රීයව පැවතීම හේතුවෙන් යම් දුරකථන අංකයක් සක්‍රීය කළ අවස්ථාවක, එකී ආංකයට සම්බන්ධ කර ඇති mCash ගිණුම අත්හිටුවීමට මොබිටෙල් හට හැකිය. අක්‍රීයව පැවති සිම්පතක් හේතුවෙන් mCash ගිණුමක් අත්හිටුවා ඇති විටෙක, නීතිය මඟින් නිශ්චය කර ඇති පරිදි, ප්‍රතිචක්‍රීකරණය කිරීමට පෙර එකී mCash ගිණුම මොබිටෙල් විසින් සංරක්ෂිත කරනු ලබයි. එවැනි mcash ගිණුමක පවතින යම් මුදල් ශේෂ, ගිණුම සංරක්ෂිතය සහ/හෝ සම්බන්ධ කර තිබූ දුරකථන අංකය ප්‍රතිචක්‍රීකරණය හේතුවෙන් අහිමි නොවන අතර, එම චක්‍රීකරණය කළ දුරකථන අංකය සඳහා mCash ගිණුමක් විවෘත කර ඇති පාරිභෝගිකයා විසින් ඉල්ලීමක් සිදුකරන තෙක් මොබිටෙල් විසින් පවත්වාගෙන යනු ලබන මධ්‍යම ගිණුමක එකී මුදල් තැන්පත් කරනු ලබයි.

9.2 mCash පාරිභෝගිකයකුට P2P ගනුදෙනුවක් කිරීමට අවශ්‍ය කෙරෙන අවස්ථාවක, P2P ගනුදෙනුව ක්‍රියාත්මක කිරීමට පෙරාතුව, mCash පැවරුම්ලාභියාගේ ජංගම දුරකථන අංකය සහ සක්‍රීය තත්වයේ සත්‍යාපනය කිරීම mCash පාරිභෝගිකයාගේ එකම වගකීම වේ. යම් තැනැත්තෙක් වැරදි mCash ගිණුමකට මුදලක් ප්‍රේෂණය කර ඇති අවස්ථාවක, වහාම ඒ බව මොබිටෙල් වෙත දැනුම්දිය යුතු අතර, එය නිවැරදි කිරීම සඳහා මොබිටෙල් වෙත ලිඛිතව ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතුය. ගනුදෙනු සිදුකිරීමෙන් දින 14 ක් ඇතුළත ඉදිරිපත් කර නොමැති පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියාකිරීමට මොබිටෙල් හට හැකියාවක් නොමැත.

9.3 එලෙසම, mCash පාරිභෝගිකයකු ඔහුගේ /ඇයගේ mCash ගිණුමට වැරදි ලෙස යම් මුදලක් ප්‍රේෂණය වී ඇති අවස්ථාවක, එකී mCash පාරිභෝගිකයා විසින් වහාම ඒ පිළිබඳව මොබිටෙල් වෙත දැනුම්දිය යුතු අතර, කිසිදු ආරවුලක් ඇතිකර ගැනීමකින් තොරව එකී මුදල් ආපසු හැරවීමට අවසර ලබාදිය යුතුය.

9.4 වැරදි සහගත මුදල් හුවමාරුවක් සම්බන්ධයෙන් ලිඛිත ඉල්ලීමක් හෝ පැමිණිල්ලක් ලැබීම මත මොබිටෙල් විසින් මූලික විමර්ශණයක් පවත්වනු ලැබේ. අදාළ ඉල්ලීම හෝ පැමිණිල්ල නිත්‍යානුකූල බවට සෑහීමට පත්වීම මත එකී ගනුදෙනුව නැවත ලබාදීම මඟින් එම වැරදි නිවැරදි කිරීම සඳහා හෝ ප්‍රායෝගික වශයෙන් සිදුකළ හැකි වෙනත් මාර්ගයකින් හෝ නීතිය මඟින් නිශ්චය කර ඇති ආකාරයට නිවැරදි කිරීම සඳහා පියවර ගනු ලැබේ. mCash පාරිභෝගිකයකුට වැරදීමකින් ගිණුමට මුදල් ලැබී ඇති විටෙක සහ එකී මුදල් ඔහුගේ/ඇයගේ mCash ගිණුමට වැරදීමකින් මාරුකර ඇති බව දැන හෝ නොදැන එකී අරමුදල ගිණුමෙන් ලබාගෙන ඇති අවස්ථාවක එකී mCash ගිනුමේ මුදල් ඇති අවස්ථාවක එම ගිණුමෙන් එකී වටිනාකම අයකර ගැනීම සඳහා මොබිටෙල් වෙත අයිතිය ඇත.

## 10 ගිණුම වසා දැමීම/අවලංගු කිරීම

10.1 කවරාකාරම වූ හේතු දැක්වීමකින් තොරව, ඕනෑම අවස්ථාවක mCash සේවාව අවලංගු/අවසන් කිරීමට මොබිටෙල් වෙත අයිතිය ඇත.

10.2 පහත සඳහන් අවස්ථානුගත තත්ත්වයන් යටතේ ඕනෑම හේතුවක් ඇතුළත්ව නමුත් ඊට පමණක් සීමා නොවී මොබිටෙල් වෙත තම පරම අභිමතය පරිදි

ඕනෑම අවස්ථාවක mCash පාරිභෝගියකයකුගේ mCash ගිණුම වහාම අත්හිටුවීම/ අවසන් කිරීම සඳහා අයිතිය ඇත.

10.2.1 මොබිටෙල් හී මතය අනුව, mCash පාරිභෝගිකයා විසින් යම් වංක, වංචා සහගත, නීති විරෝධී සහ/හෝ අපරාධ ක්‍රියාවක හෝ සාපරාධී ක්‍රියාවක නිරතව ඇත්නම්, සහ/හෝ යම් පාර්ශ්වයක්, නියාමන ආයතනයක් හෝ රජයේ නියෝජිතායතනයක් විසින් පනවා ඇති යම් ක්‍රියාවක්, ව්‍යවස්ථාවක් සහ/හෝ රෙගුලාසියක් උල්ලංඝනය කර ඇත්නම්,

10.2.2 mCash පාරිභෝගිකයා විසින් අදාළ නියමයන් සහ කොන්දේසි යටතේ යම් විධිවිධානයක් උල්ලංඝනය කර ඇත්නම්, සහ/හෝ මොබිටෙල් වෙත අගතියක් විය හැකි යම් ක්‍රියාවක නිරතව ඇත්නම් සහ/හෝ වැරදි සහගත හෝ ද්වේශ සහගත ලෙස ක්‍රියාකොට ඇත්නම්,

10.2.3 මොබිටෙල් වෙත අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී සහ මොබිටෙල් සමඟ ලියාපදිංචි වීමේ දී mCash පාරිභෝගිකයා විසින් ව්‍යාජ ලේඛන ඉදිරිපත් කර ඇත්නම් හෝ වැරදි තොරතුරු ඉදිරිපත් කර ඇත්නම් mCash ගිණුම් වහාම අවසන් කිරීමට හෝ අත්හිටුවීමට හැකිය.

10.3 mCash ගිණුම වසාදැමීමට අපේක්ෂා කරන යම් mCash පාරිභෝගිකයකු විසින් මොබිටෙල් වෙත ලිඛිතව හෝ ඉලෙක්ට්‍රොනිකව ඉල්ලීමක් ඉදිරිපත් කිරීම මඟින් එසේ කළ හැකිය. ගිණුම වසා දමන ලෙස ඉදිරිපත් කරන ඉල්ලීම මොබිටෙල් වෙත ලැබීමෙන් අනතුරුව, mCash ගිණුම අක්‍රීය කර තැබිය යුතු අතර, mCash පාරිභෝගිකයා විසින් ගිණුමේ ශේෂය ආපසු ලබාගත යුතුය. එකී මුදල් ආපසු ලබාගැනීමෙන් අනතුරුව, ව්‍යාපාරික දින 3 ක් ඇතුළත එකී

ගිණුම වසා දැමෙන අතර, අදාළ mCash පාරිභෝගිකයා වෙත ලිඛිතව දැන්වීමක් ද සිදු කෙරෙනු ඇත.

## 11 ගිවිසුම අවසන් කිරීමේ/ අත්හිටුවීමේ බලපෑම

11.1 mCash සේවාව අවසන් කිරීම හෝ කල් ඉකුත්වීම මත, mCash පාරිභෝගිකයාගේ mCash ගිණුමේ ශේෂය , මොබිටෙල් විසින් නිශ්චය කරන ලද පරිදි පරිපාලන ගාස්තු සහ වියදම් අඩුකර ගැනීමෙන් අනතුරුව ඉතිරි මුදල් ආපසු ගෙවනු ලැබේ.

11.2 10.1 වගන්තියේ කුමක් සඳහන් වුව ද, පාරිභෝගිකයා විසින් mCash ගණුදෙනු මත යම් ආරවුලක්/ ගැටලුවක් ඇතිකර ගත් අවස්ථාවක, පාරිභෝගිකයාගේ mCash ලියාපදිංචිය අවසන් කර හෝ අත්හිටුවා තිබුණ ද, අවශ්‍ය නම් අදාළ අධිකාරීන් වෙතින් නිශ්කාෂණයක් ලබාගෙන මිස, mCash පාරිභෝගිකයාගේ mCash ගිණුමේ ශේෂය ආපසු ගෙවීම හෝ ලබාදීම සඳහා මොබිටෙල් බැඳී නොසිටිනු ඇත.

11.3 mCash ගිණුම අත්හිටුවීම මත, මොබිටෙල් තම පරම අභිමතය පරිදි නැවත සම්බන්ධ කිරීමේ ගාස්තුවකට සහ මොබිටෙල් වෙත ගෙවිය යුතු සියලුම හිඟ මුදල් ගෙවීමට සහ/හෝ mCash සේවාව නැවත සම්බන්ධ කිරීම සඳහා මොබිටෙල් විසින් නියම කරනු ලබන වෙනත් යම් ගාස්තු ගෙවීමට යටත්ව mCash සේවාව නැවත  සම්බන්ධ කළ හැකිය.

11.4 මෙහි 11 වන වගන්තියේ සඳහන් විධිවිධාන මඟින් මෙහි නියමයන් සහ කොන්දේසි හෝ නීති යටතේ මොබිටෙල් වෙත ඇති වෙනත් යම් අයිතිවාසිකමකට හෝ පිළියමකට අගතියක් ඇති නොවිය යුතුය.

## 12 නියමයන් සහ කොන්දේසි සංශෝධනය කිරීම සහ වෙනස් කිරීම

12.1 මොබිටෙල් වෙත තම පරම අභිමතය පරිදි කලින් කලට මෙහි නියමයන් සහ කොන්දේසි අලුත්කිරීමට, එකතු කිරීමට, සංශෝධනය කිරීමට, හෝ වෙනස් කිරීමට අයිතිය පවතින අතර, එකී සංශෝධිත නියමයන්ට mCash පාරිභෝගිකයන් බැඳී සිටිය යුතුය. එසේ වුව ද, එකී සංශෝධිත නියමයන් පිළිබඳව සුදුසු සන්නිවේදන මාධ්‍යයක් හරහා mCash පාරිභෝගිකයන්ට දන්වනු ලැබේ.

## 13 පාලන නීතිය සහ අධිකරණ බලය

මෙම ගිවිසුම ශ්‍රී ලංකාවේ නීති යටතේ පාලනය වන අතර ඒ අනුව අර්ථ නිරූපණය විය යුතු වේ. මෙය ශ්‍රී ලංකා අධිකරණවල අධිකරණ බලයට යටත් වේ. මොබිටෙල් සහ mCash පාරිභෝගිකයකු අතර ඇතිවන ඕනෑම ආරවුලක් සාමදානයෙන් විසඳා ගැනීමට අපොහොසත් වන්නේ නම් 1995 අංක 11 දරන සංශෝධිත බේරුම්කිරීමේ පනත යටතේ නිරවුල් කිරීම සඳහා යොමු කළ යුතුය.

## 14 හිමිකම් අත්හැරීම

14.1 මොබිටෙල් විසින් mCash සේවාව “පවතින ආකාරයෙන් සපයන” අතර, විශේෂිත කාර්යයක් සඳහා සුදුසු වන බවට හෝ තත්ත්වය සහ යෝග්‍යතාව සම්බන්ධයෙන් වගකීමක් නොදරයි. තව ද, mCash සේවාව සම්බන්ධයෙන් පැන නැගිය හැකි සියලුම වගකීම් අත්හරිනු ලබයි. mCash සේවාව mCash පාරිභෝගිකයා විසින් අවදානම දැරීමේ පදනම මත භාවිතා කළ යුතුය.

14.2 mCash සේවාව නිකුත් කිරීම, භාවිතා කිරීම, ආපසු ලබාගැනීම අත්හිටුවීම සහ/හෝ අවසන් කිරීම ඇතුළත්ව නමුත් ඊට පමණක් සීමා නොවී mCash සේවාව සම්බන්ධයෙන් හෝ එමඟින් පැන නගින, mCash පාරිභෝගිකයින් සහ/හෝ වෙනත් යම් තෙවන පාර්ශ්වයක් විසින් අත්විඳින කවරාකාරම වූ යම් අලාභ, හානි, පිරිවැය හෝ වියදම් සම්බන්ධයෙන් මොබිටෙල් විසින් mCash පාරිභෝගිකයන් වෙත එකී සියලු වගකීම් බැඳී නොසිටින අතර, මොබිටෙල් හී පූර්ණ වගකීම mCash ගනුදෙනු යථා තත්වයට පත්කිරීමට සහ සාමාන්‍ය ව්‍යාපාරික කටයුත්තක් වශයෙන් සේවා සැලසීමට සීමා වන අතර විශේෂයෙන්ම ඍජු සහ වක්‍ර හානි අත්හරිනු ලැබීම ද ඇතුළත් වේ.

14.3 මොබිටෙල් හී වරදක් නිසා නොවන ගනුදෙනුකාර තෙවන පක්ෂයක් සහ mCash පාරිභෝගිකයකු අතර, mCash සේවාව හරහා සිදුකරන ලද යම් මතභේදාත්මක ගනුදෙනු සම්බන්ධයෙන් මොබිටෙල් වගකියනු නොලැබේ. ගනුදෙනු සම්බන්ධයෙන් සිදුවන යම් ආරවුල්, දෝෂ, වැරදීම් ආදිය mCash පාරිභෝගිකයා හා ගනුදෙනුකාර පාර්ශ්වය අතර විසඳා ගත යුතුය. මොබිටෙල්හී වරදක් මත සිදුවී ඇති යම් ආරවුල් විසඳීම සහ නිරාකරණය කිරීම සඳහා මොබිටෙල් විසින් පහසුකම් සපයනු ඇත.

14.4 mCash පාරිභෝගිකයකු විසින් ඔහුගේ /ඇයගේ රහස්‍ය අංකය භාවිතා කරමින් සිදුකරනු ලබන තහවුරු කිරීම්/ ගනුදෙනු සම්බන්ධයෙන් සහ ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් මොබිටෙල් සියලු වගකීම් බැහැර කරයි. එකී තහවුරු කිරීම් ආශ්‍රිත නියමයන් සම්බන්ධයෙන් යම් දෝෂයක්, වංචාවක්, වරදක්, නොසලකා හැරීමක්, අපැහැදිලි බවක් හෝ අනවබෝධය නොතකා එකී තහවුරු කිරීම් මොබිටෙල් වෙත ලැබීම මත එවැනි තහවුරු කිරීමක් අවලංගු කළ නොහැකි තහවුරු කිරීමක් වශයෙන් සලකන අතර, mCash පාරිභෝගිකයන් මත එමඟින් බැඳීමක් ඇති වේ.

## 15 වගකීම් සහ වන්දි සීමා කිරීම

15.1 නීතිය මඟින් අවසර ලත් උපරිම ප්‍රමාණයක් දක්වා, mCash සේවාව සම්බන්ධයෙන් හෝ එමඟින් පැන නඟින යම් අවහිරතා ,දෝෂ හෝ ඇණහිටීම් හෝ වෙනත් හේතු මත ඇතිවන සියලුම වගකීම් මොබිටෙල් විසින් අත්හරින අතර, mCash සේවාවේ කිසිදු බාධාවක් ඇති නොවන බවට ප්‍රතිඥා නොදෙයි. මේ සම්බන්ධයෙන් මොබිටෙල් හී එකම වගකීම වන්නේ mCash ගිණුම යථා තත්ත්වයට පත්කිරීම සහ ප්‍රායෝගික වශයෙන් හැකි තාක් ඉක්මනින් mCash සේවාව යථා පරිදි පවත්වාගෙන යාමයි.

15.2 mCash සේවාව භාවිතා කිරීමේ ප්‍රතිඵලයක් ලෙස හෝ වෙනත් කවරාකාරම හේතුවක් මත කවරාකාරම යම් පිරිවැය, පාඩු හෝ හානි හෝ ආදායම් අහිමිවීම, ලාභ අහිමිවීම හෝ පාඩු සඳහා මොබිටෙල් විසින් වගකීම නොදරයි. ඉහත සඳහන් කරුණු නොතකා කොන්ත්‍රාත්ගත හෝ සිවිල් වැරදි හෝ අන්‍යාකාරයකින් mCash පාරිභෝගිකයකු සම්බන්ධයෙන් මොබිටෙල් හී පූර්ණ වගකීම mCash පාරිභෝගිකයාගේ mCash ගනුදෙනුවේ වටිනාකමට සීමා වේ.

15.3 වංචාව, නොසළකා හැරීම, ලිඛිත අපහාස, පෞද්ගලිකත්වයට හානි කිරීම, කතෘ හිමිකම් උල්ලංඝනය කිරීම, පේටන්ට් බලපත්‍ර, විශ්වාසය කඩකිරීම හෝ වරප්‍රසාද හෝ mCash සේවාව භාවිතය මඟින් පැන නඟින කවරාකාරම යම් නීතියක් හෝ රෙගුලාසියක් කඩකිරීම හෝ mCash සේවාව හරහා හෝ එහි කොටසක් හරහා ලැබී ඇති හෝ ගබඩා කර ඇති විකාශන අයිතිය හෝ mCash පාරිභෝගිකයකුගේ යම් ක්‍රියාවක් හෝ පැහැර හැරීමක් නිසා පැන නඟින අනෙකුත් සියලු හිමිකම්පෑම් වලින් හෝ mCash සේවාව හෝ ඉන් කොටසක් අනවසර ලෙස භාවිතා කිරීම හෝ අයුතු ප්‍රයෝජන ගැනීම සම්බන්ධයෙන් වන යම් හිමිකම්පෑම් මඟින් පැන නඟින යම් අලාභ, හානි, වගකීම් හෝ වියදම් සඳහා mCash පාරිභෝගිකයා විසින් මොබිටෙල් වෙත හානිපුරණය කළයුතු අතර, හානිපුරණය කිරීමට සැලැස්විය යුතුය.

## 16 ගාස්තු සහ අයකිරීම්

16.1 mCash පාරිභෝගිකයා වෙත ඕනෑම අවස්ථාවක දැනුම්දීමක් සහිතව යම් ගාස්තු සහ අයකිරීම් වෙනස් කිරීමට සහ සංශෝධනය කිරීමට මොබිටෙල් වෙත අයිතිය ඇත. නවතම මිළ ගණන් මොබිටෙල් වෙබ් අඩවියේ පළකර ඇති අතර mCash වෙළෙන්දන් විසින් ද ප්‍රදර්ශණය කර ඇත.

16.2 උපයෝගිතා බිල්පත් ගාස්තු, mCash අලෙවිසැල් ගාස්තු සහ දැනුම්දීමක් සහිතව මොබිටෙල් විසින් කලින් කලට පැනවිය හැකි වෙනත් යම් ගාස්තු ඇතුළත්ව නමුත් ඊට පමණක් සීමා නොවී mCash සේවාව සම්බන්ධයෙන් අදාළ වන වෙනත් ගාස්තු පියවීම සඳහා mCash පාරිභෝගිකයා වගකිව යුතුය.

## 17 දැන්වීම්

17.1 mCash පාරිභෝගිකයන් වෙත යවනු ලබන යම් දැන්වීමක් පහත සඳහන් එක් ආකාරයකට යැවිය යුතුය. මොබිටෙල් වෙබ් අඩවියේ පළකිරීම, හෝ සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි පුවත්පතක පළකිරීම හෝ ඊමේල් පණිවුඩයක් යැවීම හෝ පෙර ගෙවුම් මඟින් තැපැල් කිරීම හෝ පාරිභෝගිකයාගේ MSISDN අංකයට SMS පණිවුඩයක් යැවීම මඟින් එකී පණිවුඩය ලබාදිය හැකිය.

17.2 (අ) මොබිටෙල් වෙබ් අඩවියේ පළකරන ලද්දේ නම්, ප්‍රචාරය කරන වේලාවේ දී ද,

(ආ) පුවත්පත් වල පළකරන ලද්දේ නම්, ප්‍රචාරය කරන දිනයේ දී,

(ඇ) ඊමේල් මඟින් යවන ලද්දේ නම්, එය යවන වේලාවේ දී,

(ඈ) පූර්ව ගෙවුම් තැපැල් මඟින් යවන ලද්දේ නම්, එකී ලිපිය තැපැල් කිරීමට පසු දින ද,

(ඉ) SMS පණිවුඩයක් මඟින් යවන ලද්දේ නම් SMS පණිවුඩය යවන ලද වේලාවේ දී ද,

mCash පාරිභෝගිකයන් විසින් එකී පණිවුඩ ලැබීම මත එකී දැන්වීම විධිමත් පරිදි දන්වා ඇති බවට සැළකිය යුතුය.

## 18 පුද්ගලික දත්ත භුවමාරු කරගැනීම - ක්ෂුද්‍ර ණය

ක්ෂුද්‍ර ණය සඳහා අයදුම් කිරීමේ දී එම ක්ෂුද්‍ර ණය/ ඩිජිටල් ණය සඳහා වන ඔබගේ අයදුම්පතෙහි ඔබගේ පුද්ගලික දත්ත ඇතුළත් කිරීම සඳහා ඔබ මොබිටෙල් වෙත මෙයින් බලය පවරයි. එයර් ටයිම් (Air Time) භාවිතා කිරීම, ප්‍රතිපුරණය හෝ බිල්පත් නිරවුල් කිරීමේ ඉතිහාසය සහ/හෝ ජංගම මුදල් ගිණුම සහ ආශ්‍රිත තොරතුරු ක්ෂුද්‍ර ණය ලබාගැනීම සඳහා ඔබට ඇති

සුදුසුකම් තක්සේරු කිරීම පිණිස දායක විය හැකි ආශ්‍රිත තොරතුරු ආදිය ඇතුළත්ව නමුත් ඊට පමණක් සීමා නොවී වෙනත් යම් තොරතුරු ද ඔබගේ පුද්ගලික දත්ත යටතට ඇතුළත් වේ.

මොබිටෙල් විසින් ඔබගේ පුද්ගලික දත්ත භාවිතා කරන්නේ ණය ලබාදෙන තැනැත්තන්ට ණය නිර්දේශ කිරීම සඳහා පමණි. ක්ෂුද්‍ර ණය ලැබීම සඳහා ඔබගේ යෝග්‍යතාව තක්සේරු කරනු ලබන අදාළ ණයදෙන ආයතනවලට හැර වෙනත් තැනැත්තන් සඳහා ඔබගේ පුද්ගලික දත්ත ලබා නොදෙනු ඇත.

ක්ෂුද්‍ර ණය පහසුකමක් ඉල්ලීම මඟින් , මොබිටෙල් වෙත ඔබ විසින් සපයන ලද දත්ත අදාළ ණය දෙන ආයතනවලට හෙළිදරව් කිරීමට, රැස්කිරීමට , භාවිතා කිරීමට, සකස් කිරීමට මොබිටෙල්ට හැකි බවට ඔබ මෙයින් එකඟ වේ. ක්ෂුද්‍ර ණය ලබාගැනීම සඳහා ඔබගේ යෝග්‍යතාව තීරණය කිරීමේ කාර්යය සඳහා ඔබ පිළිබඳව මොබිටෙල් විසින් උත්පාදනය කළ, රැස්කළ, භාවිතා කළ, සකස්කළ, සහ ගබඩා කළ එකී තොරතුරු මොබිටෙල් mCash පාරිභෝගිකයකු ලෙස ඔබගේ දායක ප්‍රතිශතය වශයෙන් සලකනු ඇත.

ඉන් අනතුරුව, ඕනෑම අවස්ථාවක, 7111 යන අංකය ට ඇමතුමක් ලබාදීම මඟින් ඔබගේ පුද්ගලික දත්ත වෙත ප්‍රවේශවීමට සහ නිවැරදි කිරීමට සහ/හෝ ඔබගේ පුද්ගලික දත්ත රැස්කිරීම , භාවිතා කිරීම, සකස් කිරීම සහ හෙළිදරව් කිරීම සඳහා ලබාදෙන ලද එකඟතාව අවසන් කිරීමට ද හැකිය. එසේ වූව ද, mCash හරහා ක්ෂුද්‍ර ණයක් ලබාගැනීම සඳහා ඔබගේ සුදුසුකම් තක්සේරු කිරීම සඳහා වූ පූර්ව කොන්දේසියක් ලෙස ඔබගේ එකී එකඟතාව සලකනු ලබන බව වටහා ගන්න.

## 19 ස්ථාවර නියෝග සහ mCash ගිණුම පිළිබද නියමයන් සහ කොන්දේසි

19.1 පාරිභෝගිකයකු ඔහුගේ /ඇයගේ mCash ගිණුම හරහා ක්ෂුද්‍ර ණය පහසුකමක් ලබාගැනීම සඳහා ලියාපදිංචි වන අවස්ථාවක, එකී පාරිභෝගිකයා mCash සේවාව යටතේ ස්ථාවර නියෝග ලබාදීම සඳහා ස්වයංක්‍රීයව ලියාපදිංචි වන අතර, ස්ථාවර නියෝග හරහා ණයදෙන ආයතන විසින් පනවා ඇති අනෙකුත් අධිභාරයන් සමඟ ක්ෂුද්‍ර ණය ගෙවිය යුතුය.

19.2 mCash පාරිභෝගිකයකුගේ ස්ථාවර නියෝග ආශ්‍රිත විධිවිධාන, නියමයන් සහ කොන්දේසි අවධානයට යොමු කළයුතු කරුණු වශයෙන් මෙයින් ඇතුළත් කෙරේ.

19.3 ඉහත සඳහන් කරුණු වලට පටහැනිව කුමක් සඳහන් වූව ද, අදාළ ණය දීමේ ආයතන වෙතින් ලද ඉල්ලීම් මත, පාරිභෝගිකයා වෙතින් වැඩිදුර එකඟතාවක් ලබාගැනීමකින් තොරව, අදාළ ණයදීමේ ආයතන විසින් දන්වා එවා ඇති පරිදි පාරිභෝගිකයාගේ mCash ගිනුම වෙතින් අදාළ අධිභාර සහ දඩමුදල් ඇතුළුව යම් හිඟ ණය ශේෂ අයකර ගැනීමට මොබිටෙල් වෙත බැඳීමක් පැවතිය යුතුය.

19.4 එවැනි අඩුකිරීම් සම්බන්ධයෙන් ඇතිවන යම් ආරවුල් සම්බන්ධයෙන් හැකි ඉක්මනින් සමථයකට එළඹීම සඳහා අදාළ ණයදීමේ ආයතනය සමඟ සම්බන්ධීකරණය කිරීම පිණිස එකී ආරවුල් මොබිටෙල්හී අවධානයට විධිමත් පරිදි යොමු කළ යුතුය.

**මම ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන බවත්, මට වසය අවුරුදු 18 ට වැඩි බවත් , MSISDN අංකයේ ලියාපදිංචි හිමිකරු මම බවත් මෙයින් දිවුරා ප්‍රකාශ කර සිටිමි. යම් නීතියක් යටතේ නීති විරෝධී වශයෙන් නිශ්චය කර ඇති යම් ක්‍රියාවක් සඳහා mCash සේවාව හෝ mCash ගිණුම භාවිතා නොකරන බවටත්, mCash ගිණුම සඳහා එවනු ලබන ප්‍රේෂණ සහ/හෝ ආදායම් මූලාශ්‍ර නීත්‍යානුකූල බවත්, නීති විරෝධී අන්දමින් උපයා ගන්නා ලද මුදල් නොවන බවටත් දිවුරා ප්‍රකාශ කර තහවුරු කරමි.mCash සේවාව භාවිතා කිරීම සඳහා මා විසින් සපයන ලද සියලුම තොරතුරු සත්‍ය හා නිවැරදි බවටත්, කිසිදු ආකාරයක වැරදි අර්ථ දැක්වීමක් සමන්විත නොවන බවටත් ප්‍රකාශ කර සිටිමි. ඒ අනුව, ඉහත සඳහන් කර ඇති නියමයන් සහ කොන්දේසි මා විසින් කියවා අවබෝධ කරගත් බවත්, එකී නියමයන් සහ කොන්දේසි වලට බැඳී සිටින බවටත්, සියලු ගාස්තු සහ අයකිරීම් එපරිදි ගෙවන බවටත් මෙයින් ප්‍රතිඥා දී පොරොන්දු වෙමි.**

mcash සේවාව සඳහා මා ලියාපදිංචි කරගන්නා ලෙසත්, mCash ගිණුමක් විවෘත කොට මා වෙත mCash සේවාව සපයන මෙන් මෙයින් ඉල්ලා සිටිමි.